# අ.පො.ස.(උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

## ගිණුම්කරණය I

පැය දෙකයි

සැලකිය යුතුයි :

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.

**01.** ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් නිසා ඇති වූ බලපෑම ගිණුම්කරණ සමීකරණය තුළින් පහත පරිදි නිරූපණය වේ.

| වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|
| - 45 000 | | - 50 000 | | + 5 000 |

මෙහිදී නිරූපණය වන ගනුදෙනුව වන්නේ
(1) පිරිවැය රු.45 000ක් වූ භාණ්ඩ රු. 50 000කට ණයට විකිණීම යි.
(2) රු.5 000ක පොලියක් සමඟ බැංකු ණය රු. 50 000 ක් ගෙවීම යි.
(3) ණයහිමියෙකුට ගෙවිය යුතු රු.50 000ක් පියවීම සඳහා රු. 45 000ක් ගෙවීම යි.
(4) රු.50 000ක භාණ්ඩ 10%ක එකතු කළ අගය මත බදු (VAT) සහිතව ණයට මිලදී ගැනීම යි.
(5) ධාරණ වටිනාකම රු.45 000ක යන්ත්‍රයක් රු. 50 000කට ණයට විකිණීම යි. (........)

**02.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 75 000 ක අලාභයක් ලැබූ ව්‍යාපාරයකට අදාළව පහත සඳහන් තොරතුරු සපයා ඇත. මෙම ව්‍යාපාරය 2013.04.01 දින ආරම්භ කරන ලදී.

| | රු. '000 |
|---|---|
| වර්ෂය තුළ මුළු වගකීම්වල වැඩිවීම | 900 |
| ගැනිලි | 50 |
| අතිරේක ප්‍රාග්ධනය යෙදවීම | 225 |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ වත්කම්වල **වැඩිවීම** හෝ **අඩුවීම** කොපමණ ද ?
(1) රු.825 000 ක වැඩිවීම කි. (2) රු. 975 000 ක අඩුවීම කි. (3) රු.975 000 ක වැඩිවීම කි.
(4) රු.1 000 000 ක වැඩිවීම කි. (5) රු.1 150 000 ක වැඩිවීම කි. (........)

**03.** ගොඩනැගිලි නඩත්තු කිරීම්, වර්ෂය සඳහා ආදායම් බදු, ගැනිලි, අඩමාන ණය සඳහා වෙන් කිරීම යන ගිණුම් අනුපිළිවෙළින් වර්ග කරනුයේ, පහත සඳහන් කුමන ආකාරයට ද?
(1) වියදම්, වියදම්, හිමිකම්, වත්කම් (2) වියදම්, වගකීම්, වියදම්, ආදායම්
(3) වියදම්, ආදායම්, හිමිකම්, වත්කම් (4) වත්කම්, වත්කම්, හිමිකම්, වගකීම්
(5) වත්කම්, ආදායම්, හිමිකම්, වත්කම් (........)

**04.** ජනවාරි මාසය තුළදී ආයතනයක් රු. 100 000 ක් වටිනා භාණ්ඩ ගැනුම්කරුවෙකුට ඉන්වොයිස් කර ඇත. නමුත් ගැනුම්කරු වෙත යවා ඇත්තේ රු. 90 000 ක් වටිනා භාණ්ඩ පමණක් බව පසුව අනාවරණය විය. මෙම වෙනස ආයතනයේ පොත්වල සටහන් කිරීමට අදාළ ජර්නල් සටහන වන්නේ:

| | හර | බැර |
|---|---|---|
| (1) | ආපසු එවුම් ගිණුම | ණයගැති ගිණුම |
| (2) | ණයහිමි ගිණුම | ආපසු යැවුම් ගිණුම |
| (3) | විකුණුම් ගිණුම | ආපසු යැවුම් ගිණුම |
| (4) | ණයහිමි ගිණුම | ගැනුම් ගිණුම |
| (5) | විකුණුම් ගිණුම | ණයගැති ගිණුම |

(........)

**05.** පහත කුමන ප්‍රකාශය සුළු මුදල් අග්‍රිම ක්‍රමය සම්බන්ධයෙන් **නිවැරදිවේ ද?**
(1) සුළු මුදල් ගෙවීම් පිළිබඳ මූලාශ්‍ර ලියවිල්ලක් ලෙස හරපත භාවිත කෙරේ.
(2) සුළු මුදල් අග්‍රිම ක්‍රමය මුදල් පිළිබඳව අභ්‍යන්තර පාලන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය.
(3) සෑම අග්‍රිම කාලයක් අවසානයේදී ම එක සමාන මුදල් ප්‍රමාණයක් සුළු මුදල් ගෙවීම වෙනුවෙන් ප්‍රතිපූරණය කෙරේ.
(4) සෑම අග්‍රිම කාලයක් අවසානයේදී සුළු මුදල් භාරකරු සතුව ඇති මුදලට සමාන වටිනාකමක් ප්‍රතිපූරණය කෙරේ.
(5) අග්‍රිම කාලය අවසානයේදී සුළු මුදල් භාරකරු සතුව ඇති මුදලෙහි සහ එම කාලය තුළ වැය කර ඇති මුදලෙහි එකතුව අග්‍රිම මුදලට සමාන වේ. (........)

**06.** ව්‍යාපාරයක සේවකයින්ගේ මාසික දළ වේතනය රු. 400 000ක් වූ අතර, සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිළිවෙළින් රු. 60 000 ක් හා රු. 40 000 ක් විය. වේතන මුදලින් ගෙවා ඇතිමුත් සේවක අර්ථ සාධක අරමුදල් දායකය ගෙවනු ලබන්නේ ඉදිරි මාසයේදී ය. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ පහත සඳහන් කුමන ආකාරයට ද?

| | වත්කම් (රු.) | = | වගකීම් (රු.) | + | හිමිකම් (රු.) |
|---|---|---|---|---|---|
| (1) | - 360 000 | = | + 40 000 | | - 400 000 |
| (2) | - 360 000 | = | + 60 000 | | - 420 000 |
| (3) | - 360 000 | = | + 100 000 | | - 460 000 |
| (4) | - 400 000 | = | + 100 000 | | - 500 000 |
| (5) | - 460 000 | = | + 40 000 | | - 500 000 |

(........)

[2 වැනි පිටුව බලන්න

**07.** පහත සඳහන් කුමන ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදිවේ ද**?
A - අඛණ්ඩ පැවැත්මක් නොමැති ව්‍යාපාරවල සියලු වත්කම් ජංගම වත්කම් ලෙස සැලකේ.
B - ආරක්ෂණ සංකල්පයට අනුව ඉඩමක වෙළෙඳපළ වටිනාකම වැඩිවීම ගිණුම්ගත කළ යුතු වේ.
C - සංගතතා සංකල්පයට අනුව, ව්‍යාපාරයක් තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කළ යුතු වේ.
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) A හා C පමණි. (........)

**08.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සංකල්පීය රාමුවට අනුව පහත සඳහන් කුමන නිර්ණායක ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් හඳුනා ගැනීමේ දී සපුරාලිය යුතු ද?
A - එම අයිතමය වගකීමක නිර්වචනයට අනුකූල වීම.
B - අයිතමය හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයකින් පිටතට ගලා යෑමේ හැකියාවක් තිබීම.
C - විශ්වාසවන්ත ලෙස මැනිය හැකි පිරිවැයක් හෝ වටිනාකමක් අයිතමයට තිබීම.
(1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම. (........)

**09.** ව්‍යාපාරයක 2013.03.31 දිනට අවසාන තොගය රු. 30 000ක් වැඩියෙන් ද, 2014.03.31 දිනට අවසාන තොගය රු. 10 000ක් අඩුවෙන් ද, ගණනය කර ඇත. මෙමගින් මෙම වර්ෂ දෙකෙහි ලාභයට ඇතිවන බලපෑම කොපමණ ද?

| | 2013.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය | 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය |
|---|---|---|
| (1) | රු. 30 000කින් වැඩි වේ. | රු. 10 000කින් අඩු වේ. |
| (2) | රු. 30 000කින් අඩු වේ. | රු. 10 000කින් වැඩි වේ. |
| (3) | රු. 30 000කින් වැඩි වේ. | රු. 20 000කින් අඩු වේ. |
| (4) | රු. 30 000කින් වැඩි වේ. | රු. 40 000කින් අඩු වේ. |
| (5) | රු. 30 000කින් අඩු වේ. | රු. 40 000කින් වැඩි වේ. |

(........)

**10.** ව්‍යාපාරයක් 2014.03.31 දිනට රු. 70 000ක ධාරණ වටිනාකමක් සහිත උපකරණයක් හුවමාරු කරමින්, රු. 100 000ක් වටිනා නව උපකරණයක් එදින ලබා ගන්නා ලදී. මෙම ගනුදෙනුව සඳහා පැරණි උපකරණය සමඟ මුදලින් රු. 40 000ක් ගෙවන ලදී. උපකරණ හුවමාරු කිරීමේ දී ලාභය හෝ අලාභය කොපමණ ද?
(1) ලාභය රු. 10 000 (2) අලාභය රු. 10 000 (3) ලාභය රු. 30 000
(4) අලාභය රු. 30 000 (5) අලාභය රු. 50 000 (........)

**11.** ''ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 දේපළ පිරියත සහ උපකරණ'' හි ඇතුළත් නිර්වචන කිහිපයක් පහත දැක්වේ.
A - වත්කමේ වටිනාකමෙන් එහි සමුච්චිත ක්ෂය අඩුකළ පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වනු ලබන වටිනාකම.
B - දැනුම සහ කැමැත්ත සහිත පාර්ශවයන් අතර අතේ දුරින් සිදුවන ගනුදෙනුවක දී වත්කමක් හුමවාරුවන වටිනාකම.
C - වත්කමක පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයෙන් එහි සුන්බුන් අගය අඩුකළ පසු ලැබෙන වටිනාකම.
ඉහත නිර්වචන අතරින් වත්කමක **සාධාරණ අගය, ධාරණ වටිනාකම** හා **ක්ෂය කළ හැකි වටිනාකම** යන්න පිළිවෙළින් දක්වනුයේ:
(1) A, B හා C (2) A, C හා B (3) B, A හා C (4) B, C හා A (5) C, A හා B (........)

- **ප්‍රශ්න අංක 12, 13 සහ 14 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

පහත සඳහන් තොරතුරු 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පසිඳු, දිලීප සහ රුක්ෂාන් හවුල්ව්‍යාපාරයට අදාළ වේ.
A - දිලීපගේ වේතනය වාර්ෂිකව රු. 24 000කි.
B - ඉහත වේතනවලින් රු. 12 000ක් වර්ෂය තුළදී ගෙවා ඇත.
C - පසිඳු, දිලීප හා රුක්ෂාන් අතර බෙදා ගත් ලාභ කොටස් පිළිවෙළින් රු. 40 000 ක් රු. 30 000 ක් හා රු. 20 000 ක් වේ.
D - රුක්ෂාන්ට ගෙවිය යුතු ණය පොළී රු. 3 000ක් පිළිබඳ ව සටහන් තබා නැත.
E - පසිඳු හා රුක්ෂාන්ගේ භාණ්ඩ ගැනිලි පිළිවෙළින් රු. 3 000 ක් හා රු. 2 000 ක් වූ අතර, ඒ සම්බන්ධව පොත්වල සටහන් තබා නැත.

**12.** ඉහත කුමන අයිතම හවුල්කරුවන්ට කරනු ලබන ලාභාලාභ විසර්ජන ලෙස සැලකේ ද?
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B, C හා D පමණි. (5) A, B, C, D හා E යන සියල්ලම. (........)

**13.** 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය:
(1) රු. 90 000 කි. (2) රු. 102 000 කි. (3) රු. 106 000 කි.
(4) රු. 114 000 කි. (5) රු. 116 000 කි. (........)

**14.** ඉහත දී ඇති සියලු තොරතුරු සැලකිල්ලට ගත් පසු, 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ, හවුල් ව්‍යාපාරයේ හිමිකමේ වැඩිවීම වන්නේ:
(1) රු. 94 000 (2) රු. 97 000 (3) රු.100 000 (4) රු. 104 000 (5) රු. 116 000 (........)

**15.** ව්‍යාපාර ආයතනයක් එක්තරා ගිණුම් වර්ෂයක් තුළ දී රු. 20 000ක ඇසුරුම් ද්‍රව්‍ය මිලට ගෙන ඇත. මෙයින් රු. 4 000ක ඇසුරුම් ද්‍රව්‍ය වර්ෂය තුළ හානියට පත් වූ අතර, රු. 9 000ක තොගයක් ප්‍රයෝජනයට ගෙන ඇත. ඉහත සිදුවීම් හේතුවෙන් එම ගිණුම් වර්ෂයේ වියදමෙහි වැඩි වීම වන්නේ:
(1) රු. 4 000 (2) රු. 7 000 (3) රු. 9 000 (4) රු. 13 000 (5) රු. 20 000 (........)

- **ප්‍රශ්න අංක 16 සහ 17 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින ලක්නාත් සමාගමට පහත ගනුදෙනු අදාළ වේ.

A - ව්‍යාපාරයේ නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රයක් අත්පිට මුදලට මිලදී ගැනීම.
B - තුන්මසකින් කල් පිරෙන රු. 50 000ක භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම.
C - මූල්‍ය කල්බදු යටතේ මිලදී ගත් මෝටර්රථය සඳහා වාරිකය ගෙවීම.
D - රු. 50 බැගින් වූ ප්‍රතිෂ්ඨාවක් සහිතව සාමාන්‍ය කොටස් 10 000ක් දැනට සිටින කොටස්කරුවන්ට සංචිත භාවිතයෙන් නිකුත් කිරීම.

**16.** ඉහත සඳහන් කුමන ගනුදෙනු තුළින් මුදල් ප්‍රවාහයන් ඇතිවේ ද?
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B හා D පමණි. (5) B, C හා D පමණි. (........)

**17.** ඉහත කුමන ගනුදෙනුවලින් මූල්‍ය ක්‍රියාකාරකම්වලට අදාළව මුදල් ප්‍රවාහයන් ඇතිවේ ද?
(1) B පමණි. (2) C පමණි. (3) B හා C පමණි.
(4) B හා D පමණි. (5) C හා D පමණි. (........)

**18.** පහත සඳහන් තොරතුරු රවිඳුගේ ව්‍යාපාරයට අදාළ වේ.

| | **2014.03.31** | **2013.03.31** |
|---|---|---|
| තොගය | 300 000 | 200 000 |
| ණයගැතියෝ | 180 000 | 140 000 |

2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ණයගැතියන්ගෙන් රු. 920 000 ක් ලැබුණු අතර, අත්පිට විකුණුම් රු. 790 000 ක් විය.
ව්‍යාපාරය පිරිවැය මත 40% ක ලාභ ප්‍රතිශතයක් සහිතව විකුණුම් සිදු කරයි. ව්‍යාපාරයේ 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගැනුම් කොපමණ ද?
(1) රු. 1 134 000 (2) රු. 1 150 000 (3) රු. 1 350 000 (4) රු. 1 550 000 (5) රු. 1 564 000 (........)

- **ප්‍රශ්න අංක 19, 20 සහ 21 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

පහත සඳහන් තොරතුරු සීමිත දුෂ්මන්ත සමාගමට අදාළ වේ.

| | **2014.03.31 (රු. '000)** | **2013.03.31 (රු. '000)** |
|---|---|---|
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| කොටසක් රු. 200/- බැගින් වූ සාමාන්‍ය කොටස් | 13 000 | 13 000 |
| කොටසක් රු. 5/- බැගින් ලාභාංශ හිමි නිදහස් කළ නොහැකි වරණීය කොටස් 200 000 | 4 000 | 4 000 |
| **සංචිත** | | |
| පොදු සංචිතය | 3 400 | 3 000 |
| රඳවාගත් ඉපැයුම් | 3 600 | 2 000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| 15% දිගු කාලීන ණය | 2 000 | 2 000 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු ආදායම් බදු | 100 | 80 |
| ණය හිමියෝ | 140 | 150 |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ගෙවූ ආදායම් බදු රු. 280 000 කි.

**19.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු පෙර ලාභය:
(1) රු. 1 600 000 (2) රු. 2 400 000 (3) රු. 2 700 000
(4) රු. 3 000 000 (5) රු. 3 300 000 (........)

**20.** 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ පොළී ආවරණ අනුපාතය:
(1) වාර 08 (2) වාර 09 (3) වාර 10 (4) වාර 11 (5) වාර 12 (........)

**21.** 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (අවසාන හිමිකම මත):
(1) 10.0% (2) 12.5% (3) 13.7% (4) 15.0% (5) 16.5% (........)

- **ප්‍රශ්න අංක 22 සහ 23 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

නැණස පුස්තකාල සංගමයේ 2013.03.31 දිනට යාවජීව සාමාජික මුදල් ගිණුමේ ශේෂය රු. 150 000කි. ඉන් 10%ක ප්‍රමාණයක් වාර්ෂිකව සාමාජික මුදල් ආදායමට එකතු කරයි. වාර්ෂික සාමාජික මුදල රු. 500 ක් වන අතර, 2014.03.31 දිනට යාවජීව සාමාජිකයන් හැර සාමාජික සංඛ්‍යාව 200කි. 2013.03.31 දිනට සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයන් 20ක් ද ඉදිරි වර්ෂයට සාමාජික මුදල් ගෙවූ සාමාජිකයන් 25ක් ද විය. 2014.03.31 දිනට සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයන් 30ක් ද ඉදිරි වර්ෂයට ද සාමාජික මුදල් ගෙවූ සාමාජිකයන් 20ක් ද විය.

**22.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ හඳුනාගත් සාමාජික මුදල් ආදායම:
(1) රු. 67 500 (2) රු. 90 000 (3) රු. 102 500 (4) රු. 115 000 (5) රු. 150 000 (........)

**23.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදලින් ලද සාමාජික ගාස්තු:
(1) රු. 52 500 (2) රු. 75 000 (3) රු. 87 500 (4) රු. 92 500 (5) රු. 100 000 (........)

[4 වැනි පිටුව බලන්න

**● ප්‍රශ්න අංක 24 සහ 25 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක 2014 මාර්තු මාසයේ වැටුප් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| මූලික වැටුප | රු. 75 000 |
| අතිකාල දීමනා | රු. 3 000 |
| වෙනත් දීමනා | රු. 15 000 |
| | රු. 93 000 |
| අඩු කිරීම් :- | |
| උත්සව අත්තිකාරම් | රු. 3 000 |
| වැටුප් අත්තිකාරම් | රු. 7 500 |

| | | |
|---|---|---|
| සේවක අර්ථසාධක (EPF) අරමුදල් දායකය - | සේවක | 8% |
| | සේව්‍ය | 12% |
| සේවා නියුක්තිකයන්ගේ භාර (ETF) අරමුදල් දායකය | | 3% |

(EPF, ETF ගණනයේ දී අතිකාල දීමනා සැලකිල්ලට නොගැනේ.)

**24.** 2014 මාර්තු මාසය සඳහා සේවකයන් සම්බන්ධ මුළු වියදම:

(1) රු. 90 000 කි. (2) රු. 93 000 කි. (3) රු. 106 500 කි. (4) රු. 106 950 කි. (5) රු. 113 700 කි. (........)

**25.** පහත සඳහන් කුමන සටහන් 2014 මාර්තු මාසයේ EPF දායකය සම්බන්ධව **නිවැරදි** වේ ද?

| | **EPF වියදම් ගිණුම** හර (රු.) | **වැටුප් ගිණුම** හර (රු.) | **ගෙවිය යුතු EPF** බැර (රු.) |
|---|---|---|---|
| (1) | 9 000 | 6 000 | 15 000 |
| (2) | 10 800 | 7 200 | 18 000 |
| (3) | 11 160 | 7 440 | 18 600 |
| (4) | 18 000 | - | 18 000 |
| (5) | 18 600 | - | 18 600 |

(........)

**26.** නිෂ්පාදිතයකට අදාළ තොරතුරු කීපයක් පහත දී ඇත.

| | |
|---|---|
| ස්ථාවර පොදු කාර්ය පිරිවැය | රු. 400 000 |
| ආරක්ෂිත ආන්තිකය | රු. 200 000 |
| දායක විකුණුම් අනුපාතය | 60% |

නිෂ්පාදිතයට අදාළ මුළු දායකය කොපමණ ද?

(1) රු. 200 000 කි. (2) රු. 240 000 කි. (3) රු. 360 000 කි. (4) රු. 520 000 කි. (5) රු. 600 000 කි. (........)

**● ප්‍රශ්න අංක 27 සහ 28 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

සීමිත ඉසුරු සමාගම පැරණි යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් සඳහා මුදල් ආයෝජනය කිරීමට අදහස් කරයි. ඇස්තමේන්තුගත තොරතුරු පහත පරිදි වේ.

| | **(රු.)** |
|---|---|
| නව යන්ත්‍රයේ ගැනුම් මිල | 200 000 |
| සවි කිරීමේ ගාස්තු | 25 000 |
| පැරණි යන්ත්‍රයේ පිරිවැය | 100 000 |
| පැරණි යන්ත්‍රය විකිණිය හැකි මිල | 50 000 |
| ආරම්භක කාරක ප්‍රාග්ධනය | 35 000 |

නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 05කි.

ශුද්ධ මුදල් ප්‍රවාහයන් පහත දැක්වේ.

| **වර්ෂය** | **1** | **2** | **3** | **4** | **5** |
|---|---|---|---|---|---|
| **ශුද්ධ මුදල් ප්‍රවාහ (රු.)** | 80 000 | 60 000 | 50 000 | 40 000 | 60 000 |

**27.** මෙම යන්ත්‍රයේ ආරම්භක ආයෝජනය වන්නේ:

(1) රු. 160 000 (2) රු. 200 000 (3) රු. 210 000 (4) රු. 250 000 (5) රු. 275 000 (........)

**28.** ආයෝජනයේ පිළිගෙවුම් කාලය කොපමණ ද?

(1) අවු. 04 (2) අවු. 03 යි මාස 06 (3) අවු. 03 යි මාස 09
(4) අවු. 05 (5) අවු. 04 යි මාස 06 (........)

● **ප්‍රශ්න අංක 29 සහ 30 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

භාණ්ඩ ඒකකයක් නිපදවීමේ දී සෘජු ද්‍රව්‍ය සඳහා රු. 300ක් ද සෘජු ශ්‍රමය සඳහා රු. 200ක් ද ලෙස පිරිවැය වැය වේ.
කර්මාන්තශාලාව නිෂ්පාදන දෙපාර්තමේන්තු 02ක් හා සේවා දෙපාර්තමේන්තු 01කින් යුක්තය. වසරක කාලයක් තුළ මෙම දෙපාර්තමේන්තුවලට අදාළ තොරතුරු පහත පරිදිය.

| දෙපාර්තමේන්තු | වක්‍ර ශ්‍රමය (රු.) | වක්‍ර අමුද්‍රව්‍ය (රු.) | භූමි ප්‍රමාණය වර්ග මීටර | සේවක සංඛ්‍යාව | සෘජු ශ්‍රම පැය | ඒකකයක් නිපදවීමට ගතවන පැය ගණන | ගබඩා අධියාචනා පත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන දෙපාර්තමේන්තුව 01 | 80 000 | 75 000 | 15 000 | 5 | 1 330 | 01 | 2 000 |
| නිෂ්පාදන දෙපාර්තමේන්තුව 02 | 60 000 | 75 000 | 10 000 | 3 | 916 | 02 | 3 000 |
| සේවා (ගබඩාව) | 15 000 | 20 000 | 5 000 | 2 | - | - | - |

තවද මෙම කාලය සඳහා පහත අයවැය ගත තොරතුරු දී ඇත.
කම්හල් කුලී රු. 120 000 සේවක සුභ සාධන වියදම් රු. 50 000
සෘජු ශ්‍රම පැය පදනම මත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**29.** නිෂ්පාදන දෙපාර්තමේන්තුව 01 සහ 02 සඳහා විභජනය කරන ලද මුළු පොදු කාර්ය පිරිවැය:
(1) රු. 169 000 හා රු. 156 000 කි. (2) රු. 237 000 හා රු. 208 000 කි.
(3) රු. 240 000 හා රු. 190 000 කි. (4) රු. 266 000 හා රු. 229 000 කි.
(5) රු. 272 500 හා රු. 222 500 කි. (........)

**30.** මෙම නිෂ්පාදිතයේ ඒකක පිරිවැය කොපමණ ද?
(1) රු. 500 යි. (2) රු. 790 යි. (3) රු. 825 යි. (4) රු. 950 යි. (5) රු. 1 200 යි. (........)

● **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ කෙටි පිළිතුරු, තිත් ඉරි මත සපයන්න.**

**31.** අදාළ තීරුවේ පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව "√" ලකුණකින් දක්වන්න.

| | | **සත්‍ය** | **අසත්‍ය** |
|---|---|---|---|
| A - | ගිණුම්කරණයේ මූලික අරමුණ ආයතනයක ගනුදෙනු පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් එහි කළමනාකරුවන්ට සැපයීමය. | ............ | ............ |
| B - | ගණුදෙනු වාර්තා කිරීමේ දී සිදුවන සියලු වැරදි ශේෂ පිරික්සුම තුළින් අනාවරණය කර ගත හැක. | ............ | ............ |
| C - | මූල්‍ය මිනුම් සංකල්පයට අනුව මුදලේ වටිනාකම ස්ථාවරව පවතී යයි උපකල්පනය කරයි. | ............ | ............ |
| D - | භාණ්ඩයක් මිලට ගැනීමේ දී ලකුණු කල මිලෙන් අඩු කරනු ලබන වෙළඳ වට්ටම, ලද වට්ටම් ගිණුමට බැර කරයි. | ............ | ............ |

**32.** වෙළෙඳ ව්‍යාපාරයක පහත සඳහන් ගනුදෙනුවලට අදාළ වන මූලික සටහන් පොත සහ ප්‍රභව ලියවිල්ල සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික පොත** | **ප්‍රභව ලියවිල්ල** |
|---|---|---|
| (1) නැවත විකිණීම සඳහා ණයට භාණ්ඩ මිලදී ගැනීම | ...................................... | ...................................... |
| (2) ව්‍යාපාරයේ භාවිතය සඳහා මෝටර්රථයක් ණයට මිලදී ගැනීම | ...................................... | ...................................... |

**33.** පහත සඳහන් ගනුදෙනු තුළින් ව්‍යාපාරයේ බැංකු ශේෂය **වැඩි වේ ද අඩු වේ ද** යන්න සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය** |
|---|---|
| (1) ණයගැතියෙකු විසින් ව්‍යාපාරයේ බැංකුවේ ඇති ජංගම ගිණුමට චෙක්පතක් තැන්පත් කිරීම | .............................. |
| (2) බැංකුව විසින් චෙක්පොත් ගාස්තු අය කිරීම | .............................. |
| (3) ව්‍යාපාරයේ විදුලිබිල චෙක්පතකින් ගෙවීම | .............................. |
| (4) බැංකුවේ තැන්පත් කළ චෙක්පතක් අගරු වීම | .............................. |

[6 වැනි පිටුව බලන්න

**34.** ව්‍යාපාරයක රු. 13 000ක ගැනුම් ඉන්වොයිසියක්, ගැනුම් ජර්නලයේ රු. 31 000 ලෙස වාර්තා කොට එහි පොදු ලෙජරයට ද පිටපත් කොට ඇත.

(අ) ඉහත වරද නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන ලියන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

........................................................................................................................................ .

........................................................................................................................................ .

(ආ) මෙම වරද නිසා ලාභයට ඇතිවන බලපෑම කොපමණ දැයි තීරණය කර එය වැඩි වීමක් ද අඩු වීමක් ද වෙනස් නොවීමක් ද යන්න සඳහන් කරන්න.

........................................................................................................................................ .

**35.** මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න.

(1) ........................................................................................................................................ .

(2) ........................................................................................................................................ .

**36.** ව්‍යාපාරයක් එක්තරා ගිණුම් වර්ෂයක් තුළ මිලට ගත් තොගයක් සම්බන්ධ තොරතුරු පහත වේ.

| | **රු. '000** |
|---|---|
| ලැයිස්තුගත මිල (රු. 6 000 බැගින් ඒකක 1 000) | 6 000 |
| වෙළෙඳ වට්ටම් | 300 |
| ගෙන ඒමේ කුලී | 100 |
| බෙදාහැරීමේ වියදම් | 600 |
| වර්ෂය අග ඉතිරි තොගය ඒකක 100කි. | |

වර්ෂය අවසාන තොගයේ පිරිවැය කොපමණ ද?

........................................................................................................................................ .

**37.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක තොරතුරු පහත දැක්වේ.

| | **රු. '000** |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 1 500 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 800 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 1 100 |
| අමුද්‍රව්‍ය තොගයේ අඩු වීම | 200 |
| ප්‍රාථමික පිරිවැයට ගණනය කළ නොනිමි තොගයේ වැඩි වීම | 150 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) ප්‍රාථමික පිරිවැය (රු.)

........................................................................................................................................ .

(ii) මුළු නිෂ්පාදන පිරිවැය (රු.)

........................................................................................................................................ .

**38.** ව්‍යාපාරයක 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ණයගැතියන් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

| | **රු.** |
|---|---|
| 2013.04.01 දිනට ණයගැති ශේෂය | 120 000 |
| 2014.03.31 දිනට ණයගැති ශේෂය | 180 000 |
| වර්ෂය තුළ බොල්ණය කපා හැරීම් | 4 800 |
| කපාහළ බොල්ණය ආපසු ලැබීම | 6 000 |

සෑම වර්ෂයකම අවසාන ණයගැතියන්ගේ ශේෂය මත 4% ක් අඩමාණ ණය ලෙස වෙන් කෙරේ.

(i) 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා ලද බොල්ණය සහ අඩමාන ණය වටිනාකම කොපමණ ද?

........................................................................................................................................ .

(ii) 2014.03.31 දිනට ණයගැති ශුද්ධ වටිනාකමෙහි **අඩු වීම** හෝ **වැඩි වීම** කොපමණ ද ?

........................................................................................................................................ .

**39.** සමානව ලාභාලාභ බෙදා ගනිමින් නිම්මි සහ සඳුන් විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙනයන ලදී. 2013.04.01 දින රුවනි ද හවුල්කරුවකු ලෙස බැඳුණි. එදින සිට නිම්මි, සඳුන් සහ රුවනි 3 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීමට එකඟ විය. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය ගැළපූ පසුව රුවනිගේ ප්‍රාග්ධනය රු. 50 000කින් අඩු වූ අතර, සඳුන්ගේ ප්‍රාග්ධනය රු. 50 000කින් වැඩි විය.

2013.04.01 දිනට කීර්තිනාමය කොපමණ ද ?

........................................................................................................................................ .

[7 වැනි පිටුව බලන්න

**40.** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ ගිණුම්කරණයට අදාළ වන විධිවිධාන කිහිපයක් පහත දී ඇත.

A - ලාභාලාභ සමානව බෙදා ගත යුතු වේ.
B - ප්‍රාග්ධනයට පොළී හිමි නොවේ.
C - හවුල්කරුවෙකු විශ්‍රාම ගැනීම හෝ මියගිය විට ඔහුගේ / ඇයගේ හිමිකම ණය ගිණුමකට මාරු කලවිට ඒ වෙනුවෙන් වාර්ෂිකව 5%ක පොළියක් ලබා දිය යුතු වේ.
D - ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් සපයා ඇති ණය මුදල් වෙනුවෙන් 5% ක පොළියක් හිමි වේ.

ඉහත තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | අදාළ විධිවිධාන / විධිවිධානය (අක්ෂර පමණක් දක්වන්න) |
|---|---|
| (i) හවුල් ව්‍යාපාරයක ලාභාලාභ විසර්ජනය කිරීම | ..................... |
| (ii) 24 වෙනි වගන්තිය | ..................... |
| (iii) 42 වෙනි වගන්තිය | ..................... |

**41.** ව්‍යාපාරයක තොග ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳව පහත තොරතුරු ලබා දී ඇත.

2014.01.01 - ශේෂය - ඒකකයක් රු. 500 බැගින් ඒකක 100
2014.01.15 - තොග ලැබීම් - ඒකකයක් රු. 550 බැගින් ඒකක 400
2014.01.30 - විකිණීම සඳහා තොග නිකුත් කිරීම් - ඒකක 300

(i) ව්‍යාපාරය තොග නිකුත් කිරීමේ දී මිල කරනු ලබන්නේ භරිත සාමාන්‍ය ක්‍රමයට නම්, 2014 ජනවාරි මාසය සඳහා විකුණුම් පිරිවැය කොපමණ ද ?

........................................................................................................................................... .

(ii) ව්‍යාපාරය තොග නිකුත් කිරීමේ දී මිල කරනු ලබන්නේ පෙර පිවිසි පෙර පිට ක්‍රමයට නම් 2014.01.31 දිනට තොගයේ පිරිවැය කොපමණ ද?

........................................................................................................................................... .

**42.** මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදන හඳුනාගැනීමට සම්පූර්ණ විය යුතු නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................................................... .

(2) ........................................................................................................................................... .

**43.** 2014.03.31 දිනෙන් අවසන් වසර සඳහා සීමිත මිනුර පොදු සමාගමට අදාළව පහත තොරතුරු දී ඇත.

| | **රු. '000** |
|---|---|
| කාලච්ඡේදයේ ලාභය | 5 200 |
| මෝටර් රථයක් විකිණීමේ ලාභය | 200 |
| ආදායම් බදු ගෙවීම | 300 |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂය | 100 |
| තොගයේ වැඩි වීම | 20 |
| වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම | 360 |

සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

........................................................................................................................................... .

- **ප්‍රශ්න අංක 44 සහ 45 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

**44.** සීමිත දර්ශා පොදු සමාගමේ 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ උද්ධෘතයක් පහත දී ඇත. **(රු. '000)**

| විස්තරය | සාමාන්‍ය කොටස් | නිදහස් කළ නොහැකි වරණීය කොටස් | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් |
|---|---|---|---|---|---|
| ශේෂය | 2 500 | 1 000 | - | 500 | 600 |
| A | - | - | 500 | - | (500) |
| B | 500 | - | (300) | - | (200) |
| C | 500 | - | - | - | - |
| D | - | - | - | 300 | 500 |

ඉහත A, B, C සහ D වලින් දක්වා ඇති තොරතුරු සඳහන් කරන්න.

(1) A :- ........................................................................................................................... .
(2) B :- ........................................................................................................................... .
(3) C :- ........................................................................................................................... .
(4) D :- ........................................................................................................................... .

**45.** ඉහත තොරතුරු ඇසුරින් මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වන මුදල් ප්‍රවාහය දක්වන ගනුදෙනුව කුමක් ද?

.................................................................................................................................................... .

**46.** සුනිමල්ගේ ව්‍යාපාරය, පිරිසිදු කිරීමේ කටයුතු සඳහා මිලට ගත් භාණ්ඩ තොගය රු. 165 000 කි. මින් රු. 120 000ක් වටිනා තොග ප්‍රයෝජනයට ගෙන ඇති අතර, තොගයෙන් රු. 20 000ක ප්‍රමාණයක් විනාශ වී ඇත. හානි වූ තොගය වෙනුවෙන් 75%ක රක්ෂණ වන්දි හිමි වේ.

ඉහත ගනුදෙනු සහ සිද්ධි තුළින් ව්‍යාපාරයේ ලාභයට ඇති වූ බලපෑම කොපමණ ද?

.................................................................................................................................................... .

**47.** තොග පාලන ක්‍රියාවලියේ දී භාවිතා වන පහත සඳහන් ලියවිලි මගින් ඉටුවන කාර්යය සඳහන් කරන්න.

| ලියවිල්ල | කාර්යය |
|---|---|
| (1) ගැනුම් අධියාචනා පත්‍රය | ........................................................................................ . |
| (2) මිල විමසුම | ........................................................................................ . |
| (3) බින් පත්‍රය | ........................................................................................ . |
| (4) ගබඩා ලෙජරය | ........................................................................................ . |

**48.** x නැමැති අයිතමය සඳහා ඒකක 250 000 ක වාර්ෂික ඉල්ලුමක් ඇත. එක් ඇණවුමක් සඳහා රු.40 ක් වැය වන අතර, තොග රඳවා ගැනීමේ පිරිවැය, ඒකකයක මිලෙන් 10% කි. භාණ්ඩ ඒකකයක මිල රු.50 කි.
පහත දෑ ගණනය කරන්න.

(i) ආර්ථික ඇණවුම් ප්‍රමාණය:

.................................................................................................................................... .

(ii) වසරකට ඇණවුම් කළ යුතු වාර ගණන:

.................................................................................................................................... .

**49.** සුභ සාධක සංගමයකට අදාළව වත්කම් සහ වගකීම් පිළිබඳ පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.

(රු.)

| අයිතමය | **2014.03.31** දිනට | **2013.03.31** දිනට |
|---|---|---|
| මුදල් | 12 000 | 10 000 |
| බැංකු | 22 000 | 20 000 |
| ලිපි ද්‍රව්‍ය තොග | 5 000 | 3 000 |
| වගකීම් | 3 000 | 2 000 |

(අ) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය :- රු. ................................................ .

(ආ) 2014.03.31ට සමුච්චිත අරමුදල :- රු. ........................................................................................ .

**50.** අභ්‍යාස පොත් නිෂ්පාදනය කරනු ලබන ආයතනයක පහත දැක්වෙන පිරිවැය අයිතමයන්, වර්ග කරනුයේ ප්‍රාථමික පිරිවැය ලෙස ද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ලෙස ද යන්න සඳහන් කරන්න.

| පිරිවැය අයිතමය | පිරිවැය වර්ගීකරණය |
|---|---|
| (1) අභ්‍යාස පොත් සඳහා කඩදාසි | ........................................................ |
| (2) නිෂ්පාදන වැටුප් | ........................................................ |
| (3) කම්හල් කුලී | ........................................................ |
| (4) යන්ත්‍ර ක්ෂය | ........................................................ |

***

| අ.පො.ස.(උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014 | |
|---|---|
| ගිණුම්කරණය II | පැය තුනයි |

සැලකිය යුතුයි :

* පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** සීමිත කනිෂ්කා පොදු සමාගමේ 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනට කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

**2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය (රු. '000)**

| විස්තරය | සාමාන්‍ය කොටස් | නිදහස් කළ නොහැකි වරණීය කොටස් | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| ශේෂය 2013.04.01 | 2 500 | 1 500 | 1 000 | 800 | 450 | 6 250 |
| සංචිත ප්‍රාග්ධනිත කිරීම | 800 | - | (600) | (200) | - | - |
| පොදු සංචිතයට මාරු කිරීම | - | - | - | 200 | (200) | - |
| මුළු විස්තීරණ ආදායම | - | - | 400 | - | 580 | 980 |
| ලාභාංශ :- වරණීය කොටස් | - | - | - | - | (80) | (80) |
| සාමාන්‍ය කොටස් | - | - | - | - | (100) | (100) |
| ශේෂය 2014.03.31 | 3 300 | 1 500 | 800 | 800 | 650 | 7 050 |

**2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (රු. '000)**

| | | | |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ (සටහන) | | | 6 240 |
| 15% ස්ථාවර තැන්පතු | | | 1 200 |
| ජංගම වත්කම් | | | |
| තොගය | | 175 | |
| ණයගැතියෝ | 300 | | |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම | (15) | 285 | |
| කල්බදු වාරික ගිණුම | | 125 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | | 1 125 | 1 710 |
| **මුළු වත්කම්** | | | 9 150 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | |
| සාමාන්‍ය කොටස් | | 3 300 | |
| නිදහස් කළ නොහැකි වරණීය කොටස් | | 1 500 | 4 800 |
| සංචිත | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 800 | |
| පොදු සංචිතය | | 800 | |
| රඳවාගත් ඉපැයුම් | | 650 | 2 250 |
| ජංගම නොවන වගකීම් | | | |
| 12% දිගුකාලීන ණය | | | 1 000 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 400 | |
| කොටස් නිකුත් කිරීම් | | 450 | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 65 | |
| බැංකු අයිරාව | | 185 | 1 100 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | 9 150 |

[2 වැනි පිටුව බලන්න

සටහන

දේපල පිරියත හා උපකරණ (රු. '000)

| වත්කම | පිරිවැය / ප්‍රත්‍යාගණන වටිනාකම | සමුච්චිත ක්ෂය | ධාරණ වටිනාකම |
|---|---|---|---|
| ඉඩම් | 4 400 | - | 4 400 |
| ගොඩනැගිලි | 1 600 | 600 | 1 000 |
| කාර්යාල උපකරණ | 1 800 | 960 | 840 |
| | 7 800 | 1 560 | 6 240 |

2014.03.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත ගනුදෙනු හා සිද්ධීන් සැලකිල්ලට ගෙන නොමැති බව විගණනයේ දී අනාවරණය විය.

(i) සමාගම 2013.03.31 දිනට වෙන් කරන ලද ආදායම් බද්ද රු. 65 000 ක් විය. ප්‍රවර්තන වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බද්ද රු. 410 000 කි. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග එකඟ වූ රු. 75 000 ක් ද ඇතුළුව වර්ෂය තුළ ගෙවන ලද බදු ප්‍රමාණය රු. 285 000 කි.

(ii) 2013.04.01 දින ඉඩම් රු. 4 400 000 කට සහ ගොඩනැගිලි රු. 2 000 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. ඉඩමේ ප්‍රත්‍යාගණිත වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල ගළපා ඇති අතර, තවද ගොඩනැගිලි වසර 4කට පෙර ප්‍රත්‍යාගණනය කර, එහි අලාභය රු. 200 000 ක් ආදායමට එරෙහිව කපා හැර ඇත. වර්ෂය තුළ දී කරන ලද ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කර නැත. ගොඩනැගිලි වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට 20% පිරිවැය මත බැගින් ක්ෂය කරයි.

(iii) 2013.04.01 දින පිරිවැය මත සාධාරණ අගය රු. 400 000ක් වූ යන්ත්‍රයක් කල්බදු ක්‍රමයට ලබා ගෙන ඇත. මූලික ගෙවීමක් නොමැති අතර, රු. 125 000 බැගින් සමාන වාර්ෂික වාරික 4කින් කල්බදු ණය ගෙවිය යුතුය. වාර්ෂික කල්බදු පොළී ගෙවීම පහත පරිදි වේ.

| වසර | පොළිය (රු.) |
|---|---|
| 2013/14 | 40 000 |
| 2014/15 | 30 000 |
| 2015/16 | 20 000 |
| 2016/17 | 10 000 |

2014.03.31 දින ප්‍රථම වාරිකය ගෙවා ඇත. එම මුදල් ප්‍රමාණය කල්බදු වාරික ගිණුමක වාර්තා කර ඇත. මෙම ගනුදෙනුව සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත. යන්ත්‍ර පිරිවැය මත වාර්ෂිකව 15% බැගින් ක්ෂය කළ යුතු වේ.

(iv) 2014.03.31 දිනට පැවති රු. 40 000 ක ණයගැතියකු 2014.04.20 දින බුන්වත් වී ඇති බව තහවුරු කර ඇත. වර්ෂය අවසාන ණයගැති ශේෂය මත 5%ක අඩමාන ණය වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තියයි.

(v) සමාගම 2014.02.28 දින සාමාන්‍ය කොටස් නිකුත් කිරීමක් සිදු කර ඇත. ලද මුදලින් කොටස් නිකුත් කිරීමේ වියදම වූ රු. 50 000 අඩු කර ඉතිරිය කොටස් නිකුත් කිරීමේ ගිණුමට බැර කර ඇත. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(vi) 2014.03.31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 160 000 විය.

(vii) බැංකු අයිරාව සඳහා ව්‍යාපාරයේ රු. 100 000 ක් වටිනා තොග ඇපයට තබා ඇත.

**අතිරේක තොරතුරු**

**(අ)** 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය කෙටුම්පත් කිරීමේ දී පහත ආදායම් වියදම් පමණක් සැලකිල්ලට ගෙන ඇත.

| | (රු. '000) |
|---|---|
| ගොඩනැගිලි ක්ෂය | 320 |
| කාර්යාල උපකරණ ක්ෂය | 280 |
| ණය පොළී | 100 |
| පොළී ආදායම් | 150 |
| අධ්‍යක්ෂක ගාස්තු | 210 |
| ආදායම් බදු | 285 |
| වෙනත් බෙදාහැරීමේ වියදම් | 300 |
| වෙනත් පරිපාලන වියදම් | 450 |

**(ආ)** සාමාන්‍ය කොටසක මෙන්ම වරණීය කොටසක මිල රු. 10 ක් වන අතර, වරණීය කොටසක ලාභාංශය රු. 1.20කි.

අවශ්‍ය වන්නේ:

(1) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනයක්

(2) 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(4) LKAS 2 ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව තොග සම්බන්ධ හෙළිදරව් කිරීම් 2ක් **(ලකුණු 20යි)**

**2.** **(අ)** සමානව ලාභාලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ආ දිසා සහ ගයාගේ ව්‍යාපාරයට 2013.04.01 දින සචී බඳවා ගන්නා ලදී. 2014.03.31න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම් පහත දැක්වේ.

**ජංගම ගිණුම්** **(රු'000)**

| | දිසා | ගයා | සචී | | දිසා | ගයා | සචී |
|---|---|---|---|---|---|---|---|
| ගැනිලි | 200 | 220 | 140 | ශේෂය ඉ/ගෙ | 500 | 300 | - |
| | | | | වේතන | - | - | 175 |
| | | | | ප්‍රාග්ධන පොළී | 100 | 80 | - |
| ශේෂය ප/ගෙ | 580 | 280 | 95 | ලාභ කොටස් | 180 | 120 | 60 |
| | 780 | 500 | 235 | | 780 | 500 | 235 |

අතිරේක තොරතුරු:

(i) සචී බැඳුන දින ව්‍යාපාරයට රැගෙන ආ මුදල රු. 550 000 ක් වූ අතර, එයින් රු. 50 000 ක් කීර්තිනාමය සඳහා වේ.

(ii) කීර්තිනාමය සම්බන්ධ ගැලපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදු කළ යුතු වේ.

(iii) වාර්ෂික ප්‍රාග්ධන පොළී අනුපාතය 10% කි. ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත පමණක් පොළී ගණනය කර ඇත.

(iv) 2014.01.01 දින සචී, ව්‍යාපාරයට සපයා ඇති ණය මුදල රු. 400 000 කි. පොළී පිළිබඳව එකඟතාවයකට පත්ව නොමැති බැවින්, ණය පොළී සටහන් කර නැත. මෙම ණය මුදල රු. 5 000 බැගින් වූ මාසික වාරික 80 කින් ගෙවිය යුතුය. 2014.03.31 දින වන විට පළමු වාරික තුන ගෙවා ඇත.

(v) වර්ෂය තුළ දිසා, ගයා හා සචී පිළිවෙළින් ලබා ගත් රු. 30 000, රු. 35 000 හා රු. 20 000 ක භාණ්ඩ ගැනිලි පිළිබඳ සටහන් තබා නැත.

අවශ්‍ය වන්නේ:

(1) 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවැරදි ලාභ විසර්ජනය දැක්වෙන ප්‍රකාශනයක්

(2) ඉහත අතිරේක තොරතුරු සැලකිල්ලට ගනිමින් 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජංගම ගිණුම්

(3) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධන ගිණුම්

(4) 2014.03.31 දිනට හිමිකම් හා වගකීම් සම්බන්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උද්ධෘතයන් **(ලකුණු 10යි)**

**(ආ)** ලී වලින් මල් පෝච්චි වර්ගයක් නිෂ්පාදනය කරන සුරාජි ව්‍යාපාරයේ 2014.03.31 දිනෙන් අවසන් කාර්තුවේ තොරතුරු සමහරක් පහත පරිදි වේ.

(i) <u>වත්කම්</u>

| | **2014.01.01** (රු. '**000**) | **2014.03.31** (රු. '**000**) |
|---|---|---|
| යන්ත්‍ර සහ උපකරණ | 100 000 | 90 000 |
| ලී තොග | 10 000 | 8 800 |

(ii) <u>මුදල් ගෙවීම්</u>

| | |
|---|---|
| ලී මිලට ගැනීම් | 66 000 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 15 800 |

(iii) එක් මල් පෝච්චියක් නිෂ්පාදනය සඳහා වර්ග අඩි 1/5ක් ලී අවශ්‍ය වේ. කාර්තුව මුල දී රු. 200 බැගින් මිලදී ගත් වර්ග අඩි 50ක ලී තිබූ අතර කාර්තුව තුළ ලී, වර්ග අඩියක් මිලට ගෙන ඇත්තේ රු. 220 බැගිනි.

(iv) ව්‍යාපාරයේ අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ නිකුත් කරනු ලබන්නේ පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමයට වේ.

(v) එක් මල් පෝච්චියක් නිම කිරීම සඳහා සේවකයෙකුට රු. 40 ක් ගෙවනු ලැබේ.

(vi) කාර්තුව ආරම්භයේ දී වැඩ නිම කළ මල් පෝච්චි 200 ක් තිබූ අතර, කාර්තුව අවසානයේ දී මල් පෝච්චි 100 ක් තිබුණි.

(vii) කාර්තුව තුළ යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නැත.

(viii) මල් පෝච්චියක විකුණුම් මිල රු. 150 කි.

අවශ්‍ය වන්නේ:

(1) 2014.03.31 දිනෙන් අවසන් කාර්තුව සඳහා නිෂ්පාදන ගිණුම

(2) 2014.03.31 දිනෙන් අවසන් කාර්තුව සඳහා මල් පෝච්චි විකුණුම් ආදායම **(ලකුණු 10යි)**

**(මුළු ලකුණු 20යි)**

[4 වැනි පිටුව බලන්න

**3.** **(අ)** 2014.01.01 දින විනු වෙළඳ ව්‍යාපාරයේ ආරම්භක වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | (රු. ' **000**) |
|---|---|
| මෝටර් රථ | 1 500 |
| ණය ගැතියෝ | 270 |
| ලී බඩු හා සවිකිරීම් | 95 |
| තොගය | 43 |
| බැංකු ශේෂය | 137 |
| ණය හිමියෝ | 350 |
| උපචිත මෙහෙයුම් වියදම් | 5 |

2014 ජනවාරි මාසය තුළ දී ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත පරිදි වේ.

| ගනුදෙනු අංකය | දිනය | ගනුදෙනුව |
|---|---|---|
| (1) | 2014.01.05 | රු. 40 000 වටිනා ලී බඩු හා සවි කිරීම් මිලදී ගන්නා ලදී. |
| (2) | 2014.01.08 | විනු සතු රු. 125 000ක ස්ථාවර තැන්පත් මුදල ව්‍යාපාරයට පවරන ලදී. |
| (3) | 2014.01.15 | රු. 90 000 ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගන්නා ලද අතර, ඒ සඳහා චෙක්පතක් නිකුත් කරන ලදී. |
| (4) | 2014.01.17 | පිරිවැය රු. 65 000 ක් වූ භාණ්ඩ තොගයක් රු. 80 000 විකුණන ලදී. ඒ සඳහා රු. 50 000 ක චෙක්පතක් ලැබුණි. ඉතිරිය ණයට විකුණුම් ලෙස සලකන ලදී. |
| (5) | 2014.01.20 | ණයගැතියන්ගෙන් රු. 265 000 ක මුදලක් ලැබු අතර, රු. 5 000 ක් බොල්ණය ලෙස කපා හරින ලදී. |
| (6) | 2014.01.23 | ආරම්භයේ උපචිතව තිබූ මෙහෙයුම් වියදම් ද ඇතුළුව වියදම් සඳහා රු. 35 000 ක් මුදලින් ගෙවන ලදී. |
| (7) | 2014.01.27 | විනු තම පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා රු. 8 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදී. |
| (8) | 2014.01.30 | මෝටර් රථ වාර්ෂිකව 20% අනුපාතයට සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරන ලදී. |

අවශ්‍ය වන්නේ:

(1) ඉහත ආරම්භක ශේෂයන් ද ඇතුළුව සියලුම ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. අගය වැඩිවන විට (+) ද අගය අඩුවන විට (-) ලකුණ ද සංඛ්‍යාව ඉදිරියෙන් භාවිත කරන්න.
(මේ සඳහා පහත ආකෘතිය භාවිත කරන්න)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | | වගකීම් | හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | ලී බඩු හා සවි කිරීම් | තොගය | ණය ගැතියෝ | බැංකු | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

(2) ශුද්ධ වත්කම් පදනම මත 2014 ජනවාරි මාසය සඳහා ලාභය හෝ අලාභය ගණනය කරන්න.

**(ලකුණු 10යි)**

**(ආ)** ප්‍රසාද්ගේ ව්‍යාපාරයේ 2014.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර පැත්තට වඩා බැර පැත්ත රු. 16 200කින් වැඩි වී ඇති බව අනාවරණය විය. පසුව පහත දැක්වෙන වැරදි හෙළිදරව් විය.
(ව්‍යාපාරය පාලන ගිණුම් පවත්වා නොගනී.)

(i) ගෙවූ රු. 6 000 ක ප්‍රචාරණ ගාස්තු එම ගිණුමේ සටහන් කර නැත.

(ii) රක්ෂණ ගාස්තු ගිණුමේ ශේෂය වූ රු. 3 200 ශේෂ පිරික්සුමට ගෙන නැත.

(iii) මෝටර් රථ අළුත්වැඩියා වියදම රු. 10 000 ක් මෝටර් රථ ගිණුමට හර කර ඇත.

(iv) රු. 2 400 ක ආපසු යැවුම්, ආපසු යැවුම් ජ'නලයේ දෙවරක් සටහන් කර ඇත.

(v) ලද වට්ටම් රු. 1 000 ක් දුන් වට්ටම් ගිණුමට හර කර ඇත.

(vi) විකුණුම් ජ'නලයෙහි එකතුව රු. 9 000 ක් අධිගණනය කර ඇත. **(ලකුණු 05යි)**

අවශ්‍ය වන්නේ:

(1) ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන්

(2) අවිනිශ්චිත ගිණුම **(මුළු ලකුණු 15යි)**

[5 වැනි පිටුව බලන්න

**4.** **(අ)** 2014.03.01 දිනට තීක්ෂණගේ ව්‍යාපාරයේ ණයහිමි ලේජරයේ ශේෂයන් පහත දී ඇත.

| | (රු. '000) |
|---|---|
| අසිත | 25 000 |
| විසිත | 44 000 |
| ලසිත | 12 000 |
| එකතුව | 81 000 |

2014 මාර්තු මාසය සඳහා ණයහිමියන් සමග සිදුකළ ගනුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ.

| ණයහිමියා | ගැනුම් (රු.) | ආපසු යැවුම් (රු.) | ගෙවීම් (රු.) | ලද වට්ටම් (රු.) |
|---|---|---|---|---|
| අසිත | 160 000 | - | 130 000 | 6 000 |
| විසිත | 300 000 | 4 000 | 300 000 | - |
| ලසිත | 120 000 | - | 120 000 | 2 000 |
| රකිත | 50 000 | - | 16 000 | - |
| එකතුව | 630 000 | 4 000 | 566 000 | 8 000 |

2014 මාර්තු 01 දිනට ණයහිමි ලේජරයේ ශේෂයන්ගේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමග එකඟ විය. 2014 මාර්තු 31 දිනට පාලන ගිණුමේ ශේෂය ණයහිමි ලෙජරයේ ශේෂයන්ගේ එකතුවට සමාන නොවීය. මෙම වෙනසට හේතු පහත දී ඇත.

(i) අසිතගෙන් ලද වට්ටම්වලින් රු. 3 000 ක් ණයහිමි පාලන ගිණුමට හර කර, ලද වට්ටම් ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නැත.

(ii) විසිතට යැවූ රු. 4 000 ක හරපත ඔහුගේ ගිණුමේ සටහන් කර නැත.

(iii) රු. 20 000 ක අත්පිට විකුණුම් ණයහිමි පාලන ගිණුමට බැර කර ඇත.

(iv) 2014 මාර්තු 28 දින මුදිතගෙන් ණයට ගත් භාණ්ඩවලට අදාළ රු. 12 000 ක ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජර්නලයේ සටහන් කර නැත.

(v) ගැනුම් ජ'නලයේ එකතුව රු. 603 000 ක් ලෙස පාලන ගිණුමට පිටපත් කර ඇත.

අවශ්‍ය වන්නේ:

(1) ඉහත තොරතුරු ගැලපීමට පෙර 2014 මාර්තු මාසය සඳහා ණයහිමි පාලන ගිණුම
(2) ණයහිමි පාලන ගිණුමේ නිවැරදි ශේෂය ණයහිමි ලෙජර ශේෂ එකතුව සමග සංසන්දනය කිරීමේ ප්‍රකාශනයක්
(3) 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්විය යුතු ණයහිමි ශේෂය **(ලකුණු 10යි)**

**(ආ)** 2014 මාර්තු 31 දිනට ව්‍යාපාරයක බැංකු ප්‍රකාශයෙහි රු. 8 000ක හර ශේෂයක් පැවතුණි. එදිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂ සංසන්දනය කිරීමේ දී පහත තොරතුරු අනාවරණය විය.

(i) බැංකුවේ තැන්පත් කළ රු. 25 000 ක චෙක්පත් උපලබ්ධි වී නොමැත.

(ii) සැපයුම්කරුවෙකුට නිකුත් කළ රු. 18 000ක චෙක්පතක් මෙතෙක් බැංකුවට ඉදිරිපත් කර නොමැත.

(iii) බැංකු ප්‍රකාශයට අනුව රු. 500ක බැංකු ගාස්තු හා රු. 350ක චෙක්පොත් ගාස්තු ද බැංකුවට දුන් ස්ථාවර නියෝගයක් මත ගෙවූ රක්ෂණ වාරික රු. 1 400ක් ද ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාර්තා කර නැත.

(iv) ගෙවල් කුලී සඳහා නිකුත් කළ රු. 15 000ක චෙක්පත අගරු වී ඇති අතර, ඒ පිළිබඳව ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කර නොමැත. **(ලකුණු 05යි)**

අවශ්‍ය වන්නේ:

(1) 2014 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය
(2) සංශෝධනය කිරීමට පෙර 2014 මාර්තු 31 දිනට බැංකු ගිණුමේ ශේෂය **(මුළු ලකුණු 15යි)**

[6 වැනි පිටුව බලන්න

**5.** **(අ)** ව්‍යාපාරයක යන්ත්‍ර සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(i) 2010.04.01 දින මිලට ගත් යන්ත්‍රයක වටිනාකම රු. 90 000ක් වූ අතර, වර්ෂ 10ක් අවසානයේ දී එහි සුන්බුන් අගය රු. 10 000ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(ii) 2012.10.01 දින ඉහත යන්ත්‍රයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා රු. 40 000ක නව කොටසක් සවි කරන ලදී. එම සවි කිරීම හේතුවෙන් යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය එතැන් සිට ඉදිරියට වර්ෂ 10ක් වන බවත් සුන්බුන් අගයේ වෙනසක් නොවන බවත් ඇස්තමේන්තු කරන ලදී.

(iii) 2014.01.01 දින ඉහත යන්ත්‍රය රු. 120 000ක් වූ තවත් එවැනිම යන්ත්‍රයක් සමග හුවමාරු කරන ලදී. මේ සඳහා පැරණි යන්ත්‍රය සමග අතිරේකව රු. 20 000ක් මුදලින් ගෙවීමට සිදු විය.

(iv) නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 10ක් වන බවත් එයට සුන්බුන් අගයක් නොමැති බවත් ඇස්තමේන්තු කරන ලදී.

අවශ්‍ය වන්නේ:

(1) යන්ත්‍ර හුවමාරුව සඳහා ජර්නල් සටහන්
(2) යන්ත්‍ර හුවමාරුව හේතුවෙන් 2014.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභයට සිදුවන බලපෑම දැක්වීම. **(ලකුණු 07යි)**

**(ආ)** ගනුදෙනු සටහන් කිරීම සඳහා ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කර නැති, සඳුන්ගේ ව්‍යාපාරයේ 2014.06.30 දිනට පහත තොරතුරු දී ඇත.

(i)

| **වත්කම් හා වගකීම්** | **2013.06.30 දිනට** (රු.) | **2014.06.30 දිනට** (රු.) |
|---|---|---|
| මුදල් | 80 000 | 35 000 |
| තොගය | 35 000 | 48 000 |
| ණයගැතියෝ | ? | 50 000 |
| ණයහිමියෝ | 30 000 | 14 000 |
| දේපළ, පිරියත හා උපකරණ (පිරිවැයට) | 150 000 | ? |

(ii) 2014.06.30 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සිදු වී ඇති ගනුදෙනු කිහිපයක් පහත වේ.

| | (රු.) |
|---|---|
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 223 000 |
| දුන් වට්ටම | 7 000 |
| ගෙවූ වේතන | 19 000 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 18 000 |
| මුදල් ගැනිලි | 5 000 |
| ණය හිමියන්ට ගෙවූ මුදල් | 280 000 |
| ලද වට්ටම් | 4 000 |

(iii) අතිරේක තොරතුරු:

(i) විකුණුම් මත 20% ක ලාභයක් ලැබෙන පරිදි, අත්පිට මුදලට මෙන්ම ණයට ද භාණ්ඩ විකුණා ඇත. අත්පිට විකුණුම් හා ණයගැති ලැබීම් හැර වෙනත් මුදල් ලැබීම් නැත.

(ii) 2014 ජුනි මස වේතනය රු. 8 000ක් ගෙවා නැත.

(iii) 2014.06.30 දිනෙන් අවසන් වර්ෂයේ සිට වසර අග ණයගැති ශේෂයෙන් 5% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට සහ දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත 10% ක්ෂය කිරීමටත් තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ:

(1) 2014.06.30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
(2) 2014.06.30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 08යි)**

**(මුළු ලකුණු 15යි)**

[7 වැනි පිටුව බලන්න

**6.** **(අ)** ක්‍රීඩාගාරයක් පවත්වා ගෙන යන ''විකුම්'' තරුණ සමාජයේ 2013.03.31 දිනට වත්කම් හා වගකීම් පහත පරිදි වේ.

| | (රු'000) | (රු'000) |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| ක්‍රීඩාගාරය | 500 | |
| ව්‍යායාම උපකරණ | 800 | 1 300 |
| **ජංගම වත්කම්:** | | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 50 | |
| බැංකු ශේෂය | 125 | |
| මුදල් | 40 | 215 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| යාවජීව සාමාජික මුදල | 500 | |
| ව්‍යායාම උපකරණ අරමුදල | 300 | 800 |
| **ජංගම වගකීම්:** | | |
| කලින් ලද සාමාජික මුදල් | 125 | |
| කලින් ලද අත්තිකාරම් (කායවර්ධන කටයුතු සඳහා) | 40 | 165 |

2014.03.31න් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

(i) සියලු ලැබීම් හා ගෙවීම් මුදලින් සිදු කර ඇත.

(ii) වාර්ෂික සාමාජික මුදල රු. 5 000 ක් වන අතර, සාමාජිකයන් 100ක් සිටී. තවද රු. 10 000 බැගින් යාවජීව සාමාජික මුදලක් ගෙවූ සාමාජිකයින් 50 ක් ද සිටිති. යාවජීව සාමාජික මුදලින් 10% ක් වාර්ෂිකව සාමාජික මුදල් ආදායම් ලෙස සැලකීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

(iii) වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල රු. 425 000 කි. එම මුදල තුළ පෙර වර්ෂයේ හිඟ සාමාජික මුදල ලැබීම් ද ඉදිරි වසර සඳහා සාමාජිකයන් 20 දෙනෙකු ගෙවූ මුදල් ද ඇතුළත් ය. වර්ෂය අවසානයේ සාමාජිකයන් 20 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

(iv) සාමාජිකයන්ට අමතරව බාහිර පුද්ගලයන්ට ද රු. 200 ක දෛනික ගාස්තුවක් ගෙවා කායවර්ධන පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සලසා ඇත. දින 52 ක් තුළ පුද්ගලයන් 50 දෙනෙකු කායවර්ධන පහසුකම් ලබා ගෙන රු. 550 000 ක් ගෙවා ඇති අතර, වැඩිපුර ලද මුදල ඉදිරි වර්ෂය සඳහා ලද අත්තිකාරමක් ලෙස සලකා ඇත.

(v) ව්‍යායාම උපකරණ භාරව සිටින සේවකයාට මාසිකව රු. 10 000 ක වැටුපක් ගෙවනු ලැබේ.

(vi) ප්‍රචාරණ කටයුතු සඳහා රු. 80 000 ක් ද වෙනත් වියදම් සඳහා රු. 250 000 ක් ද වර්ෂය තුළ ගෙවා ඇත.

(vii) ක්‍රීඩාගාරය සහ ව්‍යායාම් උපකරණ පිළිවෙළින් වාර්ෂිකව 5% සහ 20% බැගින් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(viii) ක්‍රීඩාගාරය පවතින ගොඩනැගිල්ලේ කොටසක් ටේබල් ටෙනිස් ක්‍රීඩාව සඳහා බාහිර පුද්ගලයෙකුට මසකට රු. 10 000 ක කුලිය 2013.04.01 දින ලබා දී ඇත. ඔහු මාස 18 ක් සඳහා ද කුලී ගෙවා ඇත.

(ix) වසර අවසානයේ රු. 50 000 ක් අත ඉතිරි ලෙස රඳවා ගෙන ඉතිරි සියලුම මුදල් බැංකුවේ තැන්පත් කර ඇත.

(x) වසර තුළ උපකරණ නඩත්තුව සඳහා රු. 75 000 ක් වැය කර ඇත.

අවශ්‍ය වන්නේ:

(1) 2013.03.31 දිනට සමුච්චිත අරමුදල
(2) 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම
(3) 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 10යි)**

**(ආ)** වෑන් රථයක් යොදා ගෙන ජංගම ළමා ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තිළිණි අදහස් කරයි. එම කටයුත්ත සඳහා ඇස්තමේන්තු ගත මාසික වියදම් මෙසේය. මසකට දින 25 ක් ව්‍යාපාර කටයුතුවල නියැලීමට මෙම වියදම් දැරිය යුතු වේ.

| | (රු.) |
|---|---|
| දිනකට රු. 5 000කට වෑන් රථයක් කුලියට ගැනීම | 125 000 |
| දිනකට රු. 1 000 බැගින් අමතර වියදම් | 25 000 |
| දිනකට රු. 500 බැගින් සහායක වැටුප | 12 500 |

ළමා ඇඳුමක් රු. 300කට මිලදී ගෙන රු. 800කට විකිණීමට බලාපොරොත්තු වේ.

අවශ්‍ය වන්නේ:

(1) මාසික පිරිවැය ආවරණය කිරීමට විකිණිය යුතු ළමා **ඇඳුම් කට්ටල** ගණන.
(2) මාසය තුළ රු. 150 000ක ලාභයක් අපේක්ෂා කරන්නේ නම්, විකිණිය යුතු ළමා **ඇඳුම් කට්ටල** ගණන.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 15යි)**

**7.** **(අ)** ගිහාන් සමාගම, පහත දැක්වෙන ආයෝජන අවස්ථා දෙකක් පිළිබඳව අවධානය යොමු කර ඇත. යන්ත්‍ර දෙකෙහිම ඵලදායී ජීවකාලය වසර 4කි. මෙයින් එක් යන්ත්‍රයක් පමණක් තෝරා ගත යුතුය.

| | **A යන්ත්‍රය** (රු.) | **B යන්ත්‍රය** (රු.) |
|---|---|---|
| මූලික ආයෝජනය | 250 000 | 250 000 |
| 1. වර්ෂයේ ලාභය | 85 000 | 65 000 |
| 2. වර්ෂයේ ලාභය | 50 000 | 45 000 |
| 3. වර්ෂයේ ලාභය | 75 000 | 60 000 |
| 4. වර්ෂයේ ලාභය / (අලාභය) | (32 000) | 22 000 |
| වර්ෂ 4 අවසානයේ සුන්බුන් අගය | 50 000 | 50 000 |

ගිහාන් සමාගමේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 15% කි.
15% වට්ටම් සාධකය :

| **කාලය / වසර** | **1** | **2** | **3** | **4** |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.87 | 0.76 | 0.66 | 0.57 |

අවශ්‍ය වන්නේ:

(1) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව)
(2) පිළිගෙවුම් කාලය
(3) ශුද්ධ වර්තමාන අගය
(4) ඉහත (1), (2) සහ (3) ට අනුව තෝරා ගත යුතු සුදුසු ආයෝජන අවස්ථාව වෙන් වෙන් ව දක්වන්න.

**(ලකුණු 10යි)**

**(ආ)** නිෂ්පාදන කටයුතු කරන ආයතනයක P නම් අමුද්‍රව්‍ය ඒකක 3 000 ක් 2014.03.01 දින කම්හල තුළ ඉතිරි වී තිබුණි. එම ආයතනයේ ගබඩා භාරකරු පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරයි.

| | | ඒකකයක මිල (රු.) | ඒකක |
|---|---|---|---|
| 2014.03.01 | ගබඩාවේ වූ තොගය | 10 | 3 000 |
| 2014.03.05 | ගැනුම් | 12 | 15 000 |
| 2014.03.10 | කම්හලට නිකුත් කිරීම් | | 10 000 |
| 2014.03.20 | කම්හල විසින් ආපසු එවීම් (ඒකකයක් රු 12ට මිලට ගත්) | | 1 000 |
| 2014.03.25 | ගැනුම් | 15 | 15 000 |
| 2014.03.28 | 03/25 දින මිලට ගත් තොගයෙන් සැපයුම්කරුවන්ට ආපසු යැවීම් | | 2 000 |

පහත සඳහන් අමතර තොරතුරු සපයා ඇත.

(i) 2014.03.31 දිනට කම්හලේ ඉතිරි තොග ඒකක 1 200 කි.

(ii) ආයතනය තොග අගය කිරීම සඳහා භරිත සාමාන්‍ය මිල ක්‍රමය අනුගමනය කරයි.

(iii) ව්‍යාපාරයේ දිනක උපරිම පරිභෝජනය ඒකක 800 කි.

(iv) උපරිම පොරොත්තු කාලය දින 15 යි.

අවශ්‍ය වන්නේ:

(1) කම්හලේ දිනක සාමාන්‍ය පරිභෝජනය (ඒකක)
(2) යළි ඇණවුම් මට්ටම
(3) යළි ඇණවුම් ප්‍රමාණය
(4) 2014.03.31 දිනට තොගයේ වටිනාකම

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 15යි)**

***